# සිංහලයා හා ප්‍රත්‍යක්ෂය

සිංහල බෞද්ධයන් මුල් තැන දෙන්නේ ප්‍රත්‍යක්ෂයෙන් ලබාගන්නා දැනුමට ය. මනස ද ඇතුළු ඉන්ද්‍රිය, ප්‍රත්‍යක්ෂයෙහි දී වැදගත් වන අතර වෙනත් ඉන්ද්‍රිය සම්බන්ධ වන අවස්ථාවල ද මනස යොදා ගැනෙයි. ප්‍රත්‍යක්ෂයෙන් පමණක් නොව වෙනත් ආකාරයෙන් ලබාගන්නා දැනුම්වලට ද මනස අවශ්‍ය ම වෙයි. මනසින් තොර දැනුමක් නැත. ප්‍රත්‍යක්ෂයෙන් ලබා ගන්නේ වර්තමානයෙහි වූ දැනුමකි. අතීත හෝ අනාගත හෝ දැනුමක් ප්‍රත්‍යක්ෂයෙන් ලබාගත නොහැකි ය. අතීතය ගැන අපට ඇත්තේ මතකයක් පමණකි. අපට අතීතය මේ මොහොතේ ප්‍රත්‍යක්ෂයෙන් ලබාගත හැක්කක් නොවේ. අප අනුරාධපුරයට ගොස් ඇති ගමනක් මේ මොහොතේ අපට අත්විඳිය හැකි නොවේ. ප්‍රත්‍යක්ෂය අත්විඳින්නකි. මතකය ද අත්විඳින්නක් නොවේ දැයි කෙනකුට ඇසිය හැකි ය. මනසින් කෙරෙන සියල්ල අත්විඳින දෑ බව සැබෑ ය. ඒ සියල්ල ඒ මොහොතේ අත්විඳින බව ද සැබෑ ය. එහෙත් මතකයක් ඇති වන්නේ කලින් ද අත්විඳ ඇති දෙයක් පිළිබඳ ව ය.

ප්‍රත්‍යක්ෂයෙහි දී මනස හැරෙන්නට අනෙක් ඉන්ද්‍රිය ද යොදා ගැනෙන්නේ යැයි කෙනකුට කිව හැකි නමුත් එහි දී ද ප්‍රශ්න ඇති වෙයි. වෙනත් කිසිම ඉන්ද්‍රියක් ආධාර කර නොගෙන අපට අනුරාධපුරයේ ශ්‍රී මහා බෝධීන්වහන්සේ වන්දනා කළ අවස්ථාවක් මතක් කර ගත හැකි ය. එය මතකයකි. එහෙත් එසේ වන්දනා කිරීම ගැන අද මේ මොහොතේ සතුටු වන්නේ නම්, ඒ පිළිබඳ පහන් සංවේගයක් ඇති කරගන්නේ නම් එය මේ මොහොතේ ම ලබාගන්නා අත්විඳීමකි. මෙහි ඇත්තේ අරමුණ පිළිබඳ ප්‍රශ්නයකි. එලෙස සතුටක් හෝ වෙනත් හැඟීමක් ඇති නොකරගෙන යමක් මතක් කරගන්නේ නම් එය අත්දැකීමක් ප්‍රත්‍යක්ෂයක් නොවන්නේ දැයි යමකුට ඇසිය හැකි ය. තව දුරටත් යමක් පිළිබඳ මතකයක් පිළිබඳ මතකයක් ඇති කර ගැනීමට නොහැකි දැයි ඇසීමට හැකි ය. අප අනුරාධපුරයට ගිය ගමනක් පිළිබඳ මතක් කළ අවස්ථාවක මතකය අපට ඇත. එවිට අපේ දෙවැනි මතකය කලින් මතකයක් පිළිබඳ වූ මතකයක් වෙයි.

මේ විශ්ලේෂණය දිගින් දිගට ගෙන යා හැකි වුව ද අපි එය මෙතැනින් නවතමු. ප්‍රත්‍යක්ෂය යන්න නිරවුල් නැති වුවත් අපේ කාර්යයන් සඳහා ඒ පිළිබඳ අපට දැන් ඉතා දළ අදහසක් වෙයි. ඒ අනුව හුදු මතකය ප්‍රත්‍යක්ෂයක් ලෙස අපි නොගනිමු. අනාගතය ගැන එතරම් සංකල්පීය ගැටළු ඇති නොවේ. අනාගතය ගැන අපට සිතිය හැකි ය. එසේ සිතීම ප්‍රත්‍යක්ෂයක් වුව ද සිතන්නේ කුමක් ද යන්න ප්‍රත්‍යක්ෂයක් නොවේ. අතීතය සම්බන්ධයෙන් ද එවැනි ම දෙයක් කිව නොහැකි නොවේ. අතීතය ගැන සිතීම ප්‍රත්‍යක්ෂයක් වුව ද එසේ සිතන දෙය ප්‍රත්‍යක්ෂයක් නොවේ යැයි අපට කිව හැකි ය. එහෙත් එහි වෙනසක් වෙයි. අනාගතය ගැන අප සිතන දෙය සමහර විට නොසිදු විය හැකි ය. අප ලබන සතියේ අනුරාධපුරයට යෑමට බලාපොරොත්තුවෙන් ඒ ගැන සිතුව ද ඇතැම් විට අපට ඒ ගමන යෑමට නොහැකි වීමට ඉඩ ඇත. අතීතය ගැන මෙන් නොව අනාගතය ගැන අප සිතන්නේ නොසිදු වූ දෙයක් පිළිබඳ ව ය. සිතීම ඒ මොහොතේ සිදුවන දෙයක් වුව ද සිතන දෑය නොසිදු වූ දෙයකි.

ප්‍රත්‍යක්ෂය කෙසේ හෝ වර්තමානයේ සිදු වන්නකි. අපේ සිතිවිලි පමණක් නොව සිතන දෙය ද අපට ඒ මොහෙතේ ම ප්‍රත්‍යක්ෂ වෙයි. මේ ලිපිය කියවීම මේ මොහොතේ ප්‍රත්‍යක්ෂයෙන් ම දන්නා දෙයකි. යම් ශබ්දයක් අපට මේ මොහොතේ ඇසුණහොත් ඒ ශබ්දය අපට මේ මොහොතේ ප්‍රත්‍යක්ෂ වෙයි. එහෙත් ප්‍රත්‍යක්ෂ වන්නේ ශබ්දයක් පමණක් බව අවධාරණය කළ යුතු ය. ඒ ශබ්දය කපුටකුගේ ශබ්දයක් බව කපුටා නොදැක අප නිගමනය කරන්නේ නම් අප ඒ නිගමනයට පැමිණෙන්නේ අනුමානයෙනි. යම් ශබ්ද විශේෂයක් කපුටන්ගේ කෑ ගැසීම ලෙස සැලකීමට අපි පුරුදු වී සිටිමු. එහෙත් අපට එසේ ඇසෙන්නේ කපුටකුගේ ශබ්දයක් යැයි අපට නිශ්චිතව ම කිව නොහැකි ය. ඒ ශබ්දය කපුටකුගේ කෑ ගැසීමක් ලෙස සලකා අපට තවත් නිගමනයකට පැමිණිය හැකි ය. එනම් ඒ අසළ කපුටකු සිටින බව ය. ඒ නිගමනයට අප එළඹෙන්නේ තර්කයෙනි. කපුටකුගේ කෑ ගැසීමක් අපට ඇසුණු බැවින් හා කෑ ගැසීම ඇසෙන්නට නම් ඒ ශබ්දය පිටකළ කපුටා ළඟපාත සිටිය යුතු බැවින් අපි අසළ කපුටකු ඇතැයි නිගමනය කරමු.

මේ නිගමන එකක්වත් ප්‍රත්‍යක්ෂ නොවේ. අපේ ප්‍රත්‍යක්ෂය යම් හඬක් පමණකි. ඒ හඬ කපුටු හඬක් යැයි ද අසළ කපුටකු ඇතැයි ද අපි නිගමනය කරමු. මේ නිගමන සියල්ල වැරදි විය හැකි ය. යම් කිසිවකු කපුටකුගේ හඬක්

© Prof. Nalin De Silva

පටිගත කර එය අපට ඇසනේනට සැලැස්ස වුවා යැයි සිතමු. එවිට අපේ පළමු නිගමනය නිවැරදි වුව ද, එනම් ඒ හඬ කපුටකුගේ ය ( පටිගත කළ ද ) යන්න නිවැරදි වුව ද අසළ කපුටකු සිටින්නේ ය යන නිගමනය වැරදි වෙයි. දැන් කපුටකු මෙන් කෑ ගැසීමට හැකි අයකු එළිමහනේ සිට එලෙස කෑ ගැසී යැයි සිතමු. එවිට අපේ පළමු නිගමනය ද වැරදි වෙයි. අපට හඬක් ඇසී ඇත. ඒ හඬ ඇසීම ප්‍රත්‍යක්‍ෂයකි. එහෙත් ඉන් ලබා ගන්නා නිගමන වැරදෙයි. ප්‍රත්‍යක්‍ෂවලින් ඔබ්බෙහි වූ අනුමාන නිගමන ආදිය ගැන විශ්වාසයක් තැබීමට සිංහල බෞද්ධයන් ට අනෙක් ඇතැම් සංස්කෘතීන්හි ජීවත්වන්නන්ට තරම් පුරුද්දක් නැත.

මිහිඳු මහා රහතන්වහන්සේ සිංහලයන්ට පළමුව දේශනා කළ ධර්මය පදනම් වුයේ චුල්ලහත්ථිපදෝපම සූත්‍රය මත ය. මෙයට හේතුව කුමක්දැයි පැහැදිලි නැති බව කලින් සඳහන් කර ඇත. ඒ ගැන අනුමානයක් ඇති කරගැනීම පවා නොකළ හැකි යැයි එහි සඳහන් වෙයි.  එහෙත් සිංහලයන්ගේ හැසිරීමත් මිහිඳු හිමිපාණන්වහන්සේ ධර්මප්‍රචාරයෙහි දී අනුගමනය කර ඇති ක්‍රමවේදයත් සලකා බැලීමේ දී තවත් එක් මතයක් ඉදිරිපත් කළ හැකි ය. කලින් කියා ඇති පරිදි එක්කෝ සිංහලයන් ඒ අවධියෙහි දී වෛදිකයන්ගේ ආභාසයෙන් අනුමානයට ද වැදගත් තැනක් දුන්නා විය හැකි ය. එබැවින් මිහිඳු මහා රහතන්වහන්සේ සිංහලයන් ඉන් මුදවා ගැනීම සඳහා ඒ ධර්මය දේශනා කළා විය හැකි ය.

එසේත් නැතහොත් සිංහලයන් ඒ වන විටත් ප්‍රත්‍යක්‍ෂයට ප්‍රධාන තැන දුන්නා විය හැකි ය. එබැවින් මිහිඳු මහා රහතන්වහන්සේ බුදු දහම සිංහලයන්ගේ සංස්කෘතියට මුළුමනින් ම බාහිර නොවන දෙයක් බව ඒත්තු ගැන්වීම සඳහා ඒ සූත්‍රය තෝරා ගත්තා විය හැකි ය. උන්වහන්සේ ගේ ධර්මප්‍රචාරය සිංහල සංස්කෘතියෙන් අනවශ්‍ය ආකාරයකට වෙනස් වූවක් නොවී ය. එයට හොඳ ම උදාහරණය වන්නේ සිංහලයන්ගේ වෘක්‍ෂ වන්දනාව ඇසුරු කර ගනිමින් බෝධි වන්දනාව හඳුන්වා දීම ය. සිංහල සංස්කෘතිය මිහිඳු හිමිපාණන් වහන්සේ වැඩම කිරීමට පළමුව වුව ද බෞද්ධ සංස්කෘතියෙන් බොහෝ වෙනස් වූවා යැයි සිතිය නොහැකි ය. බුදු සසුන මේ පොළොව මත මුල් අල්ලා සිටියේ ම එය මෙරටට ආගන්තුක නොවූ බැවින් යැයි කිව හැකි ය.

මේ කරුණ යම් ප්‍රමාණයකට විස්තර කෙරී ඇති වුව ද නැවතත් එය අවධාරණය කිරීම වැදගත් වෙයි. බුදුන් වහන්සේ වෛදික සංස්කෘතිය මත නොව ප්‍රාග් වෛදික සංස්කෘතිය මත පදනම් වූ සේක. ආර්ය සංස්කෘතියක් රැගත් ජනතාවක් භාරතයට පැමිණ ඇත්තේ අවුරුදු තුන්දහස් පන්සියයකට පමණ පෙර වයඹ දිගිනි. එසේ පැමිණි ආර්යයෝ එවකටත් දඹදිව විසූ ප්‍රාග් වෛදික ජනතාව සමග මිශ්‍ර වී (ජෛවීයව මෙන් ම සංස්කෘතිකව ද) අළුත් සංස්කෘතියක් ගොඩ නැගූහ. මේ සංස්කෘතිය වෛදික සංස්කෘතිය ලෙස අපි හඳුන්වමු. වෛදික සංස්කෘතිය ක්‍රමයෙන් දඹදිව වයඹ හා බටහිර දෙස සිට නැගෙනහිර හා ඊසාන දෙසටත්, දකුණු දෙසටත් පැතිරී ගියේ ය. මේ පැතිරී යෑමේ කතා දෙක පිළිවෙළින් මහාභාරතයෙහි හා රාමායණයෙහි විස්තර කෙරෙන බව පිළිගත හැකි ය. දකුණු දිසාවට  පසු කාලීන ව බටහිර ආසියාවෙන් ද්‍රවිඩයන් පැමිණීමෙන් එහි සංස්කෘතිය තවත් වෙනසකට භාජනය වී ඇත.

නැගෙනහිරට හා ඊසාන දෙසට වෛදික සංස්කෘතිය පැතිර යෑමට තරමක කාලයක් ගත වී ඇති බව පැහැදිලි ය. සිදුහත් කුමරු උපත ලැබුයේ අද නේපාලය නමින් හැඳින්වෙන භාරතයේ ඊසාන දෙස ප්‍රදේශයක ය. අද බෙංගාලය නමින් හැඳින්වෙන වංගයත් ඔරිස්සාව ලෙස හැඳින්වෙන කාලිංගයත් පිහිටා ඇත්තේ පැරණි භාරතයේ උතුරු කොටසේ නැගෙනහිර ය. සිදුහත් කුමරු උපත ලබන අවධියේ මේ ප්‍රදේශයට වෛදික සංස්කෘතිය පැතිර ගොස් තිබුණ ද එහි ප්‍රාග් වෛදික සංස්කෘතිය නොනැසී පැවතුණි. ධ්‍යානය භාවනාව පන්සිල් පමණක් නොව චතුස්කෝටිකය ද ප්‍රාග් වෛදික සංස්කෘතියෙහි විය.

යාග හෝම සතුන් බිලි දීම ආදිය වෛදික සංස්කෘතියෙහි අංග විය. ප්‍රාග් වෛදික සංස්කෘතියේ වූ චතුස්කෝටික න්‍යායෙහි එක් කොටසක් ඉවත් කර වෛදිකයන් ත්‍රිකෝටික න්‍යාය නිර්මාණය කර ගෙන ඇති බව පෙනී යයි. වෛදිකයන්ගේ ආයුර්වේදය ත්‍රිකෝටික න්‍යාය මත පදනම් වෙයි. සංකරාචාර්ය තුමා පසුව චතුස්කෝටිකයෙහි හතරවැනි අවස්ථාව ද එකතු කර නිර්ගුණ බ්‍රහ්මන් සහිත අද්වෛත වේදාන්තය  නිර්මාණය කෙළේ යැයි කිව හැකි ය.  සිදුහත් කුමරු ඉපදුණේ මුනිවරුන් හා පරිබ්‍රාජකයන් ද විසූ සමාජයක ය. ආළාර කාළාම, උද්දකාරාම පුත්ත, පස්වග තවුසෝ ආදීහු ප්‍රාග් වෛදික සංස්කෘතියට අයත් වූහ. ඍෂිවරු මෙන් ම යාග හෝම බිලි පූජා පැවැත් වූ

© Prof. Nalin De Silva

බමුණෝ ද වෛදික සංස්කෘතියට අයත් වූහ. බුදු දහම මෙන් ම ජෛන දහම ද වෛදික සංස්කෘතියට විරුද්ධ ව ප්‍රාග් වෛදික සංස්කෘතියෙහි පැන නැගුණු දහම් වෙයි.

ලංකාවට භාරතයෙන් පැමිණි විජයගෙන් සංකේතවත් වන පිරිස වැඩි වශයෙන් වංගයෙන් හා කාලිංගයෙන් පැමිණියෝ ය. ඔවුහු වෛදිකයන් වුවද භාරතයේ බටහිර හෝ මධ්‍ය දේශයෙහි තරමට වෛදික සංස්කෘතිය තුළ ගිලී ගොස් නොතිබුණි යැයි විශ්වාස කළ හැකි ය. තමන් ලංකාවට පැමිනෙන විට මෙරට විසූ ප්‍රාග් වෛදිකයන්ගේ සංස්කෘතිය විශාල වශයෙන් වෙනස් කිරීමට මේ වෛදිකයන්ට නොහැකි වී ඇත. මෙරට කිසිම දවසක තහවුරු වූ බ්‍රාහ්මණ ආධිපත්‍යයක් තිබී නොමැත. මෙහි ප්‍රතිඵලය වූයේ වෛදිකයන්ගේ  පැමිණීමෙන් පසු යක්ෂ නාග ආදී ප්‍රාග් වෛදික ජනයා ද  සමග මිශ්‍ර වී ගොඩ නගන ලද සිංහල ජාතිය හා සිංහල සංස්කෘතිය භාරතයේ මෙන් වෛදික සංස්කෘතිය මුල් කර ගත් එකක් නොවීම ය. එපමණක් නොව පණ්ඩුකාභය පරම්පරාවට ශාක්‍යයන්ගේ ඇති සම්බන්ධයක් ගැන භද්දකච්චනා පුවතින් පැහැදිලි වෙයි. භද්දකච්චනා කුමරිය පරිබ්‍රාජක වේශයක් ගෙන මෙරටට පැමිණීමෙන් පෙන්නුම් කරන්නේ ද මෙරටට පරිබ්‍රාජක සංස්කෘතිය ආගන්තුක නොවූ බව ය.

මේ සියල්ලෙන් පෙනී යන කරුණක් නම් බුදු දහම බිහි වූ ප්‍රාග් වෛදික සංස්කෘතිය හා ඒ පදනම් වූ චින්තනය මෙරට තිබූ බවත් වෛදිකයන් පැමිණීම නිසා එය විනාශ නොවූ බවත් ය. වෛදික සංස්කෘතිය විසින් පසු කලෙක භාරතයේ දී බුදු සසුන නැති කරනු ලැබුව ද ලංකාවෙහි දී එය එසේ නොවූයේ මෙරට ජනයා භාරතයේ මෙන් වෛදිකයන් නොවූ බැවින් හා බුදු දහමට පදනම් වූ සංස්කෘතිය හා චින්තනය මෙරට නොනැසී තිබුණු බැවිනි. එබැවින් දැනුම ලබා ගැනීමේ ප්‍රධාන ම මාර්ගය ලෙස ප්‍රත්‍යක්ෂය මිහිඳු මහා රහතන් වහන්සේ වැඩම කළ අවධියෙහි ද පිළිගැණුනු බව උපකල්පනය කිරීම වෙනත් කරුණු සමග ද සංගත වෙයි. මිහිඳු මාහිමිපාණන් වහන්සේ ප්‍රත්‍යක්ෂය ම ගැන කියැවෙන ධර්ම සූත්‍රයක් පළමු ධර් දේශනය සඳහා තෝරා ගැනීමෙන් කර ඇත්තේ බුදු දහම සිංහල සංස්කෘතිය සමග පෑහෙන බව එවක විසූ සිංහලයන්ට තහවුරු කිරීම බව සිතිය හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva